127

## බස්නාහිර පළාත්බද කොළඹ මහාධිකරණයේදිය.

## නඩු අංකය : එච්.සී.එම්.සී.ඒ. 143/07

මෙත්තානන්ද ටියුඩර් පෙරේරා විජේරත්න.

නො: 47,

බලගොල්ල,

කෙංගල්ල.

වූදිත අභියාචක

එදිරිව

අධ්‍යක්ෂක ජනරාල්.

අල්ලස් හෝ දූෂණ වැළැක්වීමේ කොමිෂම.

පැමිණිලිකාර වගඋත්තරකරු

::::::::::::::::::::::::::::::::::::::::::::::::::::::::::::::::::::::::::::::::::::::::::::

වූදිත අභියාචක වෙනුවෙන් නීතිඥ රංජිත් හිල්ලගේ සහ වගඋත්තරකරු වෙනුවෙන් අල්ලස් හෝ දූෂණ විමර්ශණ කොමිෂන් සභාවේ නීතිඥ අසිත ඇන්තනි සමග රජයේ අධි නීතිඥ සුදර්ශණ සිල්වා පෙනී සිටි.

අභියාචනා අංශය
15 JUN 2009

කොළඹ මහාධිකරණ අංක 03

මහාධිකරණ විනිසුරු : ඩබ්.ඒ.ටී.රත්නායක මැතිතුමා ඉදිරිපිටදිය.

නඩු අංකය : එච්.සී.එම්.සී.ඒ. 143/07

දිනය : 2009.06.10

සටහන් කිරීම : ල.ලේ. හසන්තා දර්ශනි විසිනි.

## නි යෝ ග ය

මෙහි වුදිත අභියාචක ( මින් පසු අභියාචක ලෙස හදුන්වනු ලබන ) උගත් මහේස්ත්‍රාත්තුමා විසින් 2006.12.05 දින ඔහුට එරෙහිව ඉදිරිපත් කර ඇති පැමිණිල්ලෙහි චෝදනා 14 න් 06 කට වරදකරු කිරීම සහ එකී චෝදනා වලට නියම කර ඇති දඩුවම් වලට එරෙහිව මෙම අභියාචනය ඉදිරිපත් කර ඇති අතර දෙපාර්ශවය විසින්ම වාචික දේශණ පැවැත්වීමෙන් පසු නියෝගයට කල් තැබීමෙන් පසුව නැවතත් 23.04.2009 දින මෝෂමක් මගින් අභියාචක වෙනුවෙන් පෙනී සිටින ලද නීතිඥ නඩුව කැඳවා මෙම අභියාචනය ඉල්ලා අස් කර ගැනීමට අවසර පතා ඇත. නමුත් අධිකරණය වෙත විමසීමක් පැවැත්වීමෙන් පසු ඒ සම්බන්ධයෙන් සෑහීමකට පත් වන්නේ නම් පමණක් එම අභියාචනය ඉල්ලා අස් කර ගැනීමට අවසර දීමට හැකි අතර පාර්ශවකරුවන් විසින් වාචික දේශණ පැවැත්වූ අවස්ථාවේදී වගඋත්තරකරුවන් වෙනුවෙන් පෙනී සිටි උගත් රජයේ නීතිඥ දැනට උගත් මහේස්ත්‍රාත්තුමා විසින් නියම කර ඇති සිර දඩුවම් සම්බන්ධයෙන් කරුණු දක්වා ඇති අතර අභියාචක වරදකරු කරන ලද චෝදනා අංක 01, 02, 05, 06, 09 සහ 10 චෝදනා සම්බන්ධයෙන් 01 වන චෝදනාවට රුපියල් එක්දහස් පන්සියයක ( රු: 1,500/-) දඩ මුදලක්ද, වසර 01 ක සිර දඩුවමක්ද නියම කර එය වසර 05 කට

ලද බවත්ය. කෙසේ වුවද උගත් මහේස්ත්‍රාත් තුමාගේ තීන්දුව නීත්‍යානුකූල නොවන බවත් ඉදිරිපත් කරන ලද පැමිණිල්ලේ සාක්ෂි නිසි ලෙස ඇගයීමෙන් තොරව තම තීන්දුව ප්‍රකාශයට පත් කර ඇති බවත් විත්තිකරුවන් අභියාචනයෙන් අධිකරණයට ප්‍රකාශ කර ඇත. තවද උගත් මහේස්ත්‍රාත් තුමා තීන්දුවේ අවස්ථා ගණනාවකදී උපකල්පන කිහිපයක් කර ඇති අතර, ඒ අනුව සැක සහිත අවස්ථාවක් ගණනාවක්ම තම තීන්දුවේ සඳහන් කර ඇති බවත් පැමිණිල්ලේ සාක්ෂි වල පරස්පර විරෝධීතා සැලකිල්ලට නොගෙන විත්තිකරුවන් වරදකරුවන් කර ඇති බවත්ය. මේ අනුව මෙම අභියාචනයෙන් විත්තිකරුවන් ඉල්ලා ඇත්තේ ඔවුන් සියළු චෝදනාවන්ගෙන් නිදොස් කර නිදහස් කරන ලෙසයි.

16 JUL 2009

මෙවැනි අභියාචනයකදී අධිකරණය උගත් මහේස්ත්‍රාත් තුමාගේ තීරණය සම්බන්ධයෙන් මැදිහත් වනුයේ එම උගත් මහේස්ත්‍රාත් තුමාගේ තීන්දුවේ නීතිමය දෝශයක් හෝ බලවත් ලෙස සාක්ෂි විශ්ලේෂණය කිරීමේ දැඩි දෝශ සහගත අවස්ථාවක් තිබුනහොත් පමණි. මේ සම්බන්ධයේන අධිකරණය **Jayasooriya Vs. State Plantation Corporation** 1995 2 Sri. L.R 379 පිටුවේ වාර්ථාගත වී ඇති නඩු තීන්දුව සම්බන්ධයෙන් අධිකරණයේ අවධානය යොමු කරන ලදී.

Ceylon Cinema and Films studio Employees Union Vs Liberty Cinema Ltd 1994 3 Sri. L.R 121 "

පිටුවේ වාර්තාගත වී ඇති තීන්දුවේ ප්‍රකාශ කර ඇත්තේ, නිතිමය දෝශයක් හැරුනු විට සිද්ධිමය කරුණු සම්බන්ධයෙන් බ ඉවත් දෝශයක් නොමැති අවස්ථාවකදී විනිසුරු තුමාගේ තීරණය කෙරෙහි මැදිහත් නොවිය යුතු බවයි. අධිකරණය මෙම නඩු තීන්දු වලින් තීරණය වී ඇති නීතිමය පදනම සළකා බලමින් උගත් මහේස්ත්‍රාත් තුමාගේ තීන්දුවේ නීතිමය දෝශයක් හෝ සාක්ෂි විශ්ලේෂණය කිරීමේ දෝශ සහගත තත්ත්වයක් ඇද්දැයි පරීක්ෂා කරමි.

16 JUL 200

මෙවැනි අල්ලස් පනත යටතේ ඉදිරිපත් කරන ලද නඩුවකදී 1 වන චූදිත රුපියල් 300ක මුදලක් තුටු පඩුරක් වශයෙන් ඉල්ලා සිටි බවත් 2 වන චූදිත මාර්ගයෙන් රුපියල් 200 භාර ගන්නා ලද බවත් හා මුදල් ඉල්ලා සිටිනු ලැබුවේ රජයේ සේවකයකු බවත් පැමිණිල්ල සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කලයුතුය. එසේම 2 වන විත්තිකරු පැමිණිලිකරුට එම රුපියල් 200 භාර ගැනීමට ආධාර අනුබල දීමද රජයේ සේවකයකු වශයෙන් 2 වන චූදිත 1 වන චූදිතට එසේ මුදල් භාර ගැනීමට ආධාර අනුබල දුන් බවත් පැමිණිල්ල සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කලයුතු වේ. එසේම 1,2 විත්තිකරුවන් රජයේ සේවකයින් බවත් අධිකරණයට සනාථ කලයුතුය. මෙවැනි අල්ලස් නඩුවකදී පැමිණිලිකරුගේ සාක්ෂිය විශ්වාසවන්ත සාක්ෂියක් ලෙස අධිකරණය සලකන්නේ නම් එම සාක්ෂිය මත පමණක් විත්තිකරුවකු වරදකරුවකු කිරීමට නිත්‍යානුකූල බලයක් විනිසුරු වරයාට ඇත. මෙවනි අපරාධමය නඩුවකදී උගත් මහේස්ත්‍රාත් වරයා විසින් සාක්ෂිකරුවන්ගේ සාක්ෂි වල විශ්වාසනියත්වය සම්බන්දයෙන් ගන්නා ලද තීරණයන්ට අභියාචනයකදී අභියාචනාධිකරණ විනිසුරු වරයා දැඩි දෝශ සහගත තත්ත්වයක් නැත්නම් මැදිහත් නොවිය

යුතුය. පැමිණිලිකරු සාක්ෂි දෙනු ලැබුවේ මහේස්ත්‍රාත් වරයා ඉදිරියේ හෙයින් ඔහුගේ සාක්ෂිය නිසි ලෙස ඇගයීමට වඩාත් හැකියාවක් ඇත්තේ මහේස්ත්‍රාත් තුමාට වේ. මහේස්ත්‍රාත් වරයා සාක්ෂි සළකා බැලීමෙන් පසු පැමිණිලිකරුගේ සාක්ෂිය විශ්වාසනියත්වයෙන් යුත් බවට සලකන්නේ නම් ඒ සිමබන්ධයෙන් අභියාචනාධිකරණය සාධාරණ හේතූන් නොමැතිව ඊට මැදිහත් නොවිය යුතුය. මෙම නඩුවේදී උගත් මහේස්ත්‍රාත් වරයා සාක්ෂි ඇගයීමෙන් පසු තිරණය කර ඇත්තේ, පැ.සා 1 විශ්වාසනියත්වයෙන් යුත් සාක්ෂිකරුවෙක් බවයි. එසේම උගත් මහේස්ත්‍රාත් වරයා තම තීන්දුවේ සදහන් කර ඇත්තේ, පැ.සා 1 ගේ සාක්ෂිය බිද හෙළීමට විත්තිය සමත් වී නැති බවයි. මේ අනුව 1 වන විත්තිකරු රුපියල් 300ක් පැමිණිලිකරුගෙන් ඉල්ලු බවත් පසුව රුපියල් 200ක් නඩුව රෙජිස්ට්‍රාර් වරයාට යැවීමට 2 වන විත්තිකරු භාරගත් බවත් පැ.සා 1 ගේ සාක්ෂිය සාධාරණ සැකයෙන් තොරව සනාථ වී ඇති බව විනිසුරු වරයා තිරණය කර ඇත. තවද උගත් විනිසුරු වරයා තිරණය කර ඇත්තේ, විත්තිය විසින් ලකුණු කර ඇති පරස්පරතාවයන් තුලින් පැ.සා 1 ගේ සාක්ෂියේ විශ්වාසනියත්වයට හානියක් සිදු නොවී ඇති බවයි. පිලිගත් නඩු තීන්දු අනුව යම් පරස්පරතාවයන්ගෙන් නඩුවේ හරයට හානියක් සිදු නොවේ නම් එම පරස්පරතාවයන් තුලින් පැමිණිලිකරුගේ සාක්ෂිය බිද වැටි නොමැති බව අධිකරණය තිරණය කලහැකිය. මේ සම්බන්ධයෙන් අධිකරණය Bhoghibhai Hirijivhi Vs state of Gujrat Air 1983 SC 752 නඩුව සම්බන්ධයෙන්ද අවධානය යොමු කරමි. මේ අනුව මහේස්ත්‍රාත් අධිකරණයේ දෙන ලද සාක්ෂිය විමසා බැලීමේදී අධිකරණයට සනාථ වන්නේ එම සාක්ෂි වල විත්තිය විසින් මතු කරන ලද පරස්පරතාවයන්ගෙන් නඩුවේ අරටුවට හානියක් සිදු නොවී ඇති බවයි.

මහේස්ත්‍රාත් වරයා සාක්ෂි විශ්ලේෂණය කිරීමෙන් පසුව එම පරස්පරතාවයන්ගෙන් නඩුවේ හරයට හානි සිදු නොවී ඇති බව නිවැරදි ලෙස තීරණය කර ඇත. පිලිගත් නඩු තීන්දු සම්බන්දයෙන්ද මහේස්ත්‍රාත් වරයා අවධානය යොමු කර ඇත. 1 වන විත්තිකරු විසින් අල්ලස් ඉල්ලීම හා 1 වන විත්තිකරු 2 වන විත්තිකරු මාර්ගයෙන් අල්ලස් ලබා ගැනීම පැමිණිල්ල විසින් නිසි ලෙස සනාථ කර ඇති බව උගත් මහේස්ත්‍රාත් වරයා තීරණය කර ඇත. 2 වන විත්තිකරු සක්‍රියව මෙම මුදල් ලබා ගැනීම 1 වන විත්තිකරු ට ආධාර අනුබල දුන් බවත් මහේස්ත්‍රාත් වරයා නිවැරදි ලෙස තීරණය කර ඇත. මහේස්ත්‍රාත් වරයා මේ සම්බන්ධයෙන් ඉදිරිපත් වූ සාක්ෂි සළකා බලා තීරණය කර ඇත්තේ, 2 වන විත්තිකරුට හුදු පෙනී සිටීමක් පමණක් එම අවස්ථාවේදී කර නොමැති බවත් 1 වන විත්තිකරුට මුදල් ලබා දීමේ චේතනාවෙන් 2 වන විත්තිකරු පැමිණිලිකරුගෙන් මෙම මුදල් භාර ගෙන ඇති බවයි. මේ සම්බන්ධයෙන් උගත් මහේස්ත්‍රාත් තුමා තීන්දුවේ ප්‍රකාශ කර ඇත්තේ, පැ.සා 1 සහ පැ.සා 2 සිටින අවස්ථාවේදී මෙම 1 වන විත්තිකරු නඩු වාර්ථාව රැගෙන ආ පසුව 1 වන විත්තිකරු 2 වන විත්තිකරුට නඩු වාර්ථාව ලබා දී පැ.සා 1 ට 2 වන විත්තිකරු රුපියල් 200ක් ලබා දෙන ලෙසට ප්‍රකාශ කර ඇති බවයි. තවද පැ.සා 1 විසින් 2 වන විත්තිකරුට 1 වන විත්තිකරුට දීමට එම මුදල් ලබා දී ඇත. එසේ නඩු වාර්ථාව සහ රු 200 ක් ලබාගෙන රැගෙන යාමෙන් මෙම වරද සම්බන්ධයෙන් ඔහුට දැනුමක් තිබූ බවට අධිකරණයට පැහැදිලි වන බව මහේස්ත්‍රාත් වරයා නඩු වාර්ථාවේ දක්වා ඇත. උගත් මහෙස්තාත් තුමාගේ මෙම තීරණය නඩු විභාගයේදී දෙන ලද සාක්ෂිය අනුව නිවැරදි තිරණයක් ලෙස මෙම අධිකරණයද සලකමි. උගත් මහේස්ත්‍රාත් තුමා

මෙම අවස්ථාවේදී 2 වන විත්තිකරු 1 වන විත්තිකරු ට සක්‍රියව චේතනාන්විතව මෙම රුපියල් 200 මුදල ලබා ගැනීමට ආධාර අනුබල දී ඇති බව තම තීරණයේ සදහන් කර ඇත. මෙය නිවැරදි නිගමනයක් ලෙස මෙම අධිකරණය සලකමි. මෙවැනි අල්ලස් නඩුවකදී විත්තිකරු අල්ලස් මුදල් ලබා ගැනීම චේතනාන්විතව ලබාගැනීමත් එම අල්ලස් මුදල ලබා ගැනීමට ආධාර අනුබල දීම චේතනාන්විතව කිරීමත් වැදගත් වේ. මහේස්ත්‍රාත් අධිකරණයේ ඉදිරිපත් වූ සාක්ෂි අනුව 1 වන විත්තිකරු එම මුදල චේතනාන්විතව අල්ලස් වශයෙන් ඉල්ලා ඇති බවත් 2 වන විත්තිකරු ඊට ආධාර අනුබල දී ඇති බවත් සාක්ෂි අනුව සාධාරණ සැකයෙන් තොරව සනාථ වී ඇත. උගත් මහේස්ත්‍රාත් තුමා එසේ චේතනාන්විතව මෙම මුදල් ලබා ගැනීම හා 2 වන විත්තිකරු ආධාර අනුබල දීම සිදු කල බව සාක්ෂි නිවැරදි ලෙස අධ්‍යනය කිරීමෙන් පසුව තීරණය කර ඇති අතර, තම තීන්දුවේ ඊට හේතුන් ද නිවැරදිව ඇතුලත් කර ඇත. උගත් මහේස්ත්‍රාත් තුමා මේ සම්බන්දයෙන් පිලිගත් ඉහළ අධිකරණ නඩු තීන්දු සම්බන්ධයෙන්ද තම අවධානය නිසි ලෙස යොමු කර ඇත. මේ අනුව උගත් මහේස්ත්‍රාත් තුමා 2 වන විත්තිකරු එම ස්ථානයේ හුදු පෙනී සිටීමක් පමණක් කර නොමැති බවත් ඔහු සාක්ෂි කූඩුවේ නැග තමන් කිසිදු දෙයක් දන්නේ නැති බවට ප්‍රකාශ කලද එය පිලිගත නොහැකි බවත් තම තීන්දුවේ සදහන් කිරීම නිවැරදි නිගමනයක් ලෙස මෙම අධිකරණය සළකමි. 2 වන විත්තිකරු 1 වන චූදිතට චේතනාන්විතවම ආධාර අනුබල නොදුන් බවට සහ හුදු පෙනී සිටීමක් පමණක් කර ඇති බව සාක්ෂි අනුව අනාවරණය වී නොමැත. 2 වන විත්තිකරු අත්අඩංගුවට ගෙන ඇත්තේ, පැ.සා 1 නඩු වාර්තාව දීමෙන් පසුව මුදල් රැගෙන රෙජිස්ට්‍රාර් වෙත එම වාර්තාව රැගෙන යමින් සිටියදීය. මේ අනුව

2 වන විත්තිකරු ක්‍රියාශීලීව මෙම වරදට සහභාගි වී ඇත. මෙම නඩුවේ 1 වන විත්තිකරු අල්ලස් වශයෙන් රුපියල් 300 ක මුදලක් පැමිණිලිකරුගෙන් ඉල්ලා සිටි බවත් පැමිණිල්ල සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කර ඇති අතර, එයින් රුපියල් 200ක මුදලක් 2 වන විත්තිකරු මගින් ලබා ගෙන ඇති බවත් පැමිණිල්ල සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කර ඇත. 1 වන විත්තිකරු ලේඛණාගාරය අසලදී පැමිණිලිකරුගෙන් මුදල් ඉල්ලා සිටි බව පැ.සා 2 ද සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇති අතර, ඒ අනුව අල්ලස් මුදල් ඉල්ලා සිටීම පිළිබඳව පැමිණිල්ලේ සාක්ෂි මගින් කරුණු සනාථ කර ඇත. පැ.සා 1 හා පැ.සා 2 ගේ සාක්ෂි බිඳ හෙලීමට මෙම නඩුවේදී විත්තිය සමත් වී නැති බවත් මෙම අධිකරණයට සනාථ වේ. 1 වන විත්කරු විසින් මුදල් ඉල්ලීම පිළිබඳව පැ.සා 1 ගේ සාක්ෂිය පැ.සා 2 අධිකරණයේ දෙන ලද සාක්ෂි වලින් තහවුරු වී ඇත. තවද මෙම නඩුවේදී පැමිණිල්ල විසින් 1,2 විත්තිකරුවන් නිල කාර්‍යයයක් ඉටු කිරීම සදහා මෙම මුදල් ඉල්ලා සිටීම හා මුදල් ලබා ගැනීම කල බව අධිකරණයට සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කර ඇති අතර, විත්තිකරුවන් රජයේ සේවකයන් බවත් නඩුවේදී විත්තිකරුවන් විසින් පිලිගෙන ඇත. මේ අනුව අල්ලස් නඩුවකදී ඔප්පු කලයුතු ප්‍රධාන අංග පැමිණිල්ල විසින් සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කර ඇත. පැමිණිල්ල විසින් මෙම නඩුවේදී නීත්‍යානුකූලව ක්‍රියා පිළිවෙල අනුගමනය කරමින් මෙම වැටලීම සිදු කර ඇති බව අධිකරණයට සනාථ කර ඇත. පැමිණිල්ල විසින් මෙම නඩුවට අදාල මුදල් සහතිකයද නඩුවට නිසි ලෙස ගොනු කර ඇත. එසේම වැටලීමට පෙර ගතයුතු නීත්‍යානුකූල පියවර සියල්ල නිසි පරිදි අනුගමනය කර ඇති බවත් අධිකරණයට පැමිණිල්ලේ සක්ෂි අනුව සනාථ වේ. සුනිල් එරෙහිව නීතිපති

නඩුවේ වාර්තා ගත වී ඇති කරුණු අනුව තහවුරු කිරීමේ සාක්ෂි වලින් තොරව පැමිණිල්ලේ එක් සාක්ෂිකරුවකුගේ සාක්ෂිය මත පමණක් අල්ලස් නඩුව සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කලයුතු බවට තීරණය කර ඇත.

16 JUL 2009

එහෙත් මෙවැනි නඩුවකදී විනිසුරු වරයා ඉදිරිපත් වූ සාක්ෂි සුපරීක්ෂාකාරීව ඇගයියයුතු බවට තීරණය වී ඇත. මේ අනුව මෙම නඩුවිද මහේස්ත්‍රාත් වරයා පැමිණිල්ල විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂි සුපරීක්ෂාකාරීව අධ්‍යනය කර ඇති බවක් අභියාචනය සළකා බැලීමේදී අධිකරණයට සනාථ වේ. කෙසේ වුවද මෙම නඩුවේදී පැ.සා 1 ගේ සාක්ෂිය උපාය දූතයාගේ සාක්ෂිය මගින් තහවුරු වී ඇත. මෙම නඩුවේදී 1,2 විත්තිකරුවන්ට නියම කරන ලද අනිවාර්‍ය සිර දඬුවම නීත්‍යානුකූල නොවන බවත් ඔවුන්ට පෙර වැරදි නොමැති බැවින් ඔහු යහපත් පුරවැසියකු කිරීම සඳහා මෙම දඬුවම අත්සිටුවීමට මහේස්ත්‍රාත් වරයාට හැකියාවක් තිබූ බව 1,2 විත්තිකරුවන් තර්ක කර ඇත. කුමාර එරෙහිව නීතිපති නඩුවේ තීන්දුව කෙරෙහි විත්තිය අවධානයට යොමු කර ඇත. කෙසේ වුවද මෙම නඩුවී කරුණු අනුව අධිකරණය විත්තිකරුවන්ට නියම කරන ලද සිර දඬුවම අත්නොසිටීමට ගත් මහේස්ත්‍රාත් වරයාගේ තීරණය නිවැරදි බවමෙම අධිකරණයද සලකමි. මෙම 1,2 විත්තිකරුවන් අධිකරණයට සම්බන්ධ රැකියාවන්හි නිරත පුද්ගලයන් බැවින් එම පුද්ගලයන් විනයානුකූලව තම රාජකාරී කිරීම වැදගත් වන බැවින් අනෙකුත් නිලධාරීන්ටද ආදර්ශයක් වන පරිදි ඔවුන්ට දැඩි දඬුවම් නියම කිරීමට මහේස්ත්‍රාත් වරයා ගෙන ඇති තීරණය නිවැරදි තීරණයක් බව මෙම අධිකරණය සලකමි. දඬුවම අත්සිටුවීමට

අධිකරණයෙන් ඉල්ලා ඇතත් ඉහත කරුණු සළකා බලා මෙම අභියාචනයේදී අධිකරණය එම ඉල්ලීම ඉවතලමි.

16 JUL 2009

මේ අනුව අධිකරණය මෙම අභියාචනය සළකා බැලීමෙන් පසු තීරණය කරනුයේ උගත් මෙහස්ත්‍රාත් තුමා තම තීරණය නිවැරදි ලෙස සාක්ෂි අධ්‍යනය කිරීමෙන් පසු කර ඇති තීරණයක් බවයි. නීතිමය හෝ සාක්ෂි බලවත් ලෙස දෝශ සහගතව විශ්ලේෂණය කිරීමක් කර නොමැතිව මෙම තීන්දුව ප්‍රකාශයට පත් කර ඇති බව අධිකරණය තීරණය කරමි. තවද උගත් මහේස්ත්‍රාත් තුමා තම තීන්දුව ප්‍රකාශයට පත් කිරීමේදී තමන් විසින් ගන්නා ලද නිගමනයට හේතුන් නිසි පරිදි තම තීන්දුවේ සටහන් කර ඇත. මේ සම්බන්ධයෙන් අධිකරණය වන්ද්‍රසේන එරෙහිව මුණවීර 1 1998 3 එස්.එල්.ආර් නඩු තීන්දුව කෙරෙහි අධිකරණයේ අවධානය යොමු කරන ලදී. මෙම නඩු තීන්දුවේ ජයසූරිය විනිසුරු තුමා ප්‍රකාශ කර ඇත්තේ, නිසි ලෙස සාක්ෂි ඇගයීමෙන් පසු තම තීන්දුව ප්‍රකාශයට පත් කලයුතු බවයි. පැමිණිල්ලේ හා විත්තියේ සාක්ෂි තම තීන්දුවේ සදහන් කිරීම පමණක් ප්‍රමාණවත් නොවන බව දක්වා ඇත. මෙම නඩු තීන්දුව අනුව අධිකරණය මහෙස්ත්‍රාත් වරයාගේ තීන්දුව සළකා බැලීමෙන් පසු තීරණය කරනුයේ උගත් මහේස්ත්‍රාත් තුමා පැමිණිල්ල විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂි පිලි ගැනීමට හේතුන් නිසි ලෙස ඇගයීමෙන් පසු අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ එම හේතුන් සටහන් කර ඇති බවයි. තවද මූස් එරෙහිව රජය 99 2 එස්.එල්.ආර් 401 වන පිටුවේ ඇති නඩු තීන්දුවේ සදහන් වී ඇත්තේ නිසි පරිදි තීන්දුව ප්‍රකාශ කලයුතු බවයි. මේ අනුවද අධිකරණයට සනාථ වන්නේ උගත් මහේස්ත්‍රාත් තුමා තම තීන්දුවේ පැමිණිල්ල විසින් ඔප්පු

කලයුතු චෝදනා වල ප්‍රධාන අංග ඔප්පු කර ඇති ආකාරය නිසි පරිදි තම තීන්දුවේ සදහන් කර ඇති බවයි. එසේම පැමිණිලිකරුවන්ගේ සාක්ෂි විශ්වසනීයත්වයෙන් යුත් බවට තිරණය කිරීමට හේතුන්ද නිසි පරිදි මහේස්ත්‍රාත් තුමා වාර්ථා කර ඇත. මහේස්ත්‍රාත් වරයා මෙවැනි නඩුවකදී පැමිණිල්ල විසින් චෝදනා ඔප්පු කලයුතු නිතිමය තත්ත්වය නිසි පරිදි ඇගයීමෙන් පසු තම තීන්දුව ප්‍රකාශයට පත් කර ඇත. එහි නිතිමය දෝශයක් අධිකරණයට දක්නට නොලැබේ. උගත් මහේස්ත්‍රත් වයාගේ තිරණයෙන් බලවත් දෝශ සහගත තත්ත්වයක් නොමැති නම් අභියාචනාධිකරණය ඊට මැදිහත් නොවිය යුතුය.

16 JUL 2009

මේ අනුව අධිකරණය මෙම සියළු කරුණු සළකා බැලීමෙන් පසු තීරණයකරනුයේ මහේස්ත්‍රාත් වයාගේ තිරණය නිවැරදි තීරණයක් බවයි. ඒ අනුව උගත් තිරණයක් ලෙස තීරණය කරමි. ඒ අනුව 1,2 විත්තිකරුවන් තම අභියාචනය සනාථ කිරීම සදහා ප්‍රමාණවත් හේතුන් සනාථ කර නොමැති බැවින් 1,2 විත්තිකරුවන්ගේ අභියාචනය නිශ්ප්‍රභා කරමි. ඒ අනුව උගත් මහේස්ත්‍රාත් තුමාගේ තින්දුව හා දඩුවම ඉවතලීමට කරන ලද ආයාචනය නිශ්ප්‍රභා කරමි. උගත් මහේස්ත්‍රාත් තුමාගේ තීන්දුව හා දඩුවම ස්ථිර කරමි.

මේ අනුව උගත් මහේස්ත්‍රාත් තුමා මෙම තීන්දුව අනුව නියම කරන ලද දඩුවම ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් නියෝග කර සිටිමි. මෙම නියෝගය මහේස්ත්‍රාත් අධිකරණයට දන්වා යැවීමට රෙජිස්ට්‍රාර් වරයාට නියෝග කර සිටිමි.

16 JUL 2009

( සුනිල් රාජපක්ෂ )

මහාධිකරණ විනිසුරු - කොළඹ.

2009-06-09

ඉහත සඳහන් වනුයේ පිටු අංක 12 දක්වා
කොළඹ මහාධිකරණයේ අංක 783/05 දරණ නඩුවේ
.......................................... බවත්
.......................................... ගේ ඉල්ලීම මත රාජකාරි
කටයුත්තක් සඳහා ගාස්තුවෙන් තොරව නොමිලේ පිටපත් කළ බවත්
මෙයින් සහතික කරමි.

දිනය : 2009/07/16

රෙජිස්ට්‍රාර්
මහාධිකරණය කොළඹ 12
පරීක්ෂා කළා